Embassy of the United States of America
Colombo

# මාධ්‍ය නිවේදනය

Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: vanhornnt@state.gov ● http://lk.usembassy.gov

Release No. 20170921

## එක්සත් ජනපද තානාපති කාර්යාලය ශ්‍රී ලංකාවේ රේගු නිලධාරීන් සඳහා උපායමාර්ගික වාණිජ පරිපාලනය සම්බන්ධයෙන් පුහුණුවක් පවත්වනු ලබයි

**සැප්තැම්බර් 21 කොළඹදීය** එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂාව සම්බන්ධ වැඩසටහන EXBS සහ ලෝක රේගු සංවිධානය ශ්‍රී ලංකාවේ රේගු නිලධාරීන් 34 දෙනෙක් සඳහා උපාය මාර්ගික වෙළදාම පාලන බලගැන්වීම සම්බන්ධව පුහුණුවක් සැප්තැම්බර් 12 සිට 15 දක්වා පවත්වන ලදී.

මෙම වැඩමුලුවේදී සාකච්ඡා කරන ලද ක්‍රමවේදයන් මගින් ජාතික ආරක්ෂාවට සහ මහජනයාගේ ආරක්ෂාවට බලපෑමක් ඇතිකළ හැකි භාණ්ඩ ඉලක්ක කරගැනීම සඳහා අවශ්‍ය දැනුම ලබාගැනීමට රේගු පරිපාලනයට මහගු අවස්ථාවක් උදාකරනු ලැබිණි. එසේම පුහුණුව මගින් රේගු නිලධාරීන්ට අවදානමක් පවත්නා නැව් භාණ්ඩ හඳුනා ගැනීමට සහ භෞතික වශයෙන් පරීක්ෂා කිරීමට අවශ්‍ය භාණ්ඩ තොග ඉලක්ක කිරීමට අවශ්‍ය දැනුම, කුශලතා සහ හැකියාව ලබාගැනීමටද හැකිවිය. මෙම පුහුණුව වැඩි අවදානමක් පවත්නා නැව්භාණ්ඩ තොග වඩාත් ඵලදායී අන්දමින් හඳුනාගැනීමට සහ උපාය මාර්ගික වෙළඳ භාණ්ඩ ඉලක්ක කරගැනීම සඳහා අවශ්‍ය දැනුම සහ කුශලතා වැඩි දියුණු කිරීමට උපකාරී විණි. එසේම මෙම පුහුණුව උපාය මාර්ගික වෙළඳ පාලනයන් (STCE) බලගැන්වීම, උපායමාර්ගික වෙළඳ පාලනයන් බලගැන්වීමේදී රේගුවේ කාර්යයභාරය, උපායමාර්ගික වෙළඳ පාලනයන් බලගැන්වීමේ ක්‍රියාපටිපාටියන් ස්ථාපිත කිරීම සහ ඒවා සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණයන්, විශාල පරිමානයේ හානි සිදුකළ හැකි ආයුධ සම්බන්ධයෙන් උපායමාර්ගික වෙළඳ පාලනයන් බලගැන්වීම අදාළ වන ආකාරය සහ උපායමාර්ගික වෙළඳ පාලනයන් උල්ලංගනය වන අවස්ථාවන් හිදී ඒවා හඳුනාගැනීම සඳහා රේගු සුසංගත පද්ධතින් හි වැදගත්කම හා අභියෝගයන් පිළිබඳවද අවධානය යොමුවිණි. රටවල් වලට භාණ්ඩ තොග ඇතුල්වීම, ප්‍රති අපනයනය සහ තමන්ගේ දේශසීමාවන්ගෙන් භාණ්ඩ බැහැරට යන ආකාරය පරීක්ෂාකර බැලීම සඳහා සුදුසුම ක්‍රියාමාර්ග යොදාගැනීම පිළිබඳව රේගුව දැඩි උනන්දුවක් දක්වනු ලබයි.

අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂක වැඩසටහනේ (EXBS) අරමුණ වන්නේ මහත් විනාශයක් සිදුකළ හැකි ආයුධ ප්‍රචලිත වීම වැළැක්වීමත් කළාපීය සාමය සහ ස්ථාවරත්වයට තර්ජනයන් වන්නාවූ සාම්ප්‍රදායික අවි භාවිතය නවතාලීමත්ය. අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂණ වැඩසටහන අවිභාවිතය ප්‍රචලිත වීම වැළැක්වීම සඳහා ක්‍රමෝපායයන් ගණනාවකින් අනුගමනය කරනු ලබයි. වෙළඳාම පාලනය කිරීම, බලපත්‍ර ලබාදීම සහ නීත්‍යානුකූල /නියාමන ක්‍රියාමාර්ග සඳහා තාක්ෂණ සහයෝගය ලබාදීම හා වරාය, දේශසීමා සහ නීතිය ක්‍රියාවට නැංවීමේ නිලධාරීන්ට පුහුණු සහ උපකරණ ලබාදීම ආදිය මෙයට ඇතුළත්වේ.